විධාන අංක - 43

## 2003 අංක 09 දරන පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය පනත

### 10(1)(අ) වැනි වගන්තිය යටතේ විධානය

2003 අංක 09 දරන පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය පනතේ 10(1)(අ) වගන්තිය මගින් පැවරී ඇති බලතල ප්‍රකාරව කටයුතු කරමින් සියලුම ඖෂධ හා විටමින් වර්ග නිෂ්පාදනය කරන්නන් හා ආනයනකරුවන් විසින්,

(අ) සෑම ඖෂධයකම සහ විටමින් වර්ගයකම දැනට පවත්නා සිල්ලර විකුණුම් මිල ;

(ආ) යම් ඖෂධයක හෝ විටමින් වර්ගයක පවත්නා සිල්ලර විකුණුම් මිලෙහි යම් සංශෝධනයක් කරන්නේ නම් එවැනි සංශෝධනයක් කිරීමට පෙර එම යෝජිත සංශෝධිත මිල, කාණ්ඩ අංකය සහ එකී සංශෝධනය ක්‍රියාත්මක වන දිනය ;

(ඇ) මෙම විධානයෙහි දිනයෙන් පසුව කිසියම් ඖෂධයක් හෝ විටමින් වර්ගයක් නිෂ්පාදනය කර සහ/හෝ ආනයනය කර ඇත්නම් එකී ඖෂධය හෝ විටමින් වර්ගය වෙළෙඳාම සඳහා ඉදිරිපත් කිරීමට පෙර මෙම විධානයෙහි (අ) සහ (ආ) කොටස්වලට අදාළ තොරතුරු ;

පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය වෙත ඉදිරිපත් කළ යුතු බවට මෙයින් විධාන කරනු ලැබේ.

මෙම විධානය වර්ෂ 2013 ජනවාරි මස 01 වැනි දින සිට බලපැවැත්වෙනු ඇත.

පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරියේ අණ පරිදි,

රූමි මර්සූක්,
සභාපති.

2012 දෙසැම්බර් මස 04 වැනි දින,
කොළඹ දී ය.

12-511/2

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.